ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2024 ජූලි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී බොහෝ විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කළ ඇතැම් ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි.

ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## A කොටස

### ප්‍රශ්න අංක 01

මුළු විෂය නිර්දේශයම ආවරණය වන අයුරින් මෙම කොටස සකස් කර තිබෙන බව පෙනේ. ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා දෙන ලද උත්තරවලින් නිවැරදි උත්තරය තේරීමත් ප්‍රශ්න අංක **1.11** සිට **1.12** දක්වා ප්‍රශ්න වලටදී ඇති උත්තර අතුරින් නිවැරදි උත්තරය ලිවීමටත් **1.13 - 1.14** ප්‍රශ්න වල සත්‍ය අසත්‍ය බව ප්‍රකාශ කිරීමත් **1.15 - 1.20** දක්වා ප්‍රශ්න වලට අයදුම්කරුවන්ට කෙටි උත්තර සැපයීමත් මෙම කොටස මගින් අපේක්ෂා කෙරේ.

මෙම කොටස යටතේ බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස ලකුණු ලබාගෙන තිබුණු අතර, සමහර අයදුම්කරුවන්ගේ උත්තරවල දුර්වලතා තිබුණි. මේ අනුව පොදුවේ දැකිය හැකි දුර්වලතා පහත පරිදි වේ.

**1.1** නිෂ්පාදන සාධක සඳහා ගෙවීම පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්නයට, එනම් ප්‍රාග්ධනයට කරන ගෙවීම් නැතහොත් ප්‍රතිලාභය පොලිය ලෙස බොහෝ සිසුන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.2** හරස් ඉල්ලුම් නම්‍යතාවය සෘණ වනවිට, අදාල භාණ්ඩය අනුපූරක භාණ්ඩ ලෙස බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.3** ආවස්ථික පිරිවැය යන මූලික ආර්ථික සංකල්පය පිළිබඳව දැනුම පිරික්සීමට අසා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් නිවැරදි උත්තරය ආවස්ථික පිරිවැය ලෙස හඳුනාගෙන තිබුණි.

**1.4** දිගුකාලීන නිශ්පාදන ක්‍රියාවලිය පිළිබඳව නිවැරදි නොවන ප්‍රකාශය, නිෂ්පාදන සාධක විචල්‍ය හා ස්ථාවර වශයෙන් බෙදා වෙන් කිරීම ලෙස බොහෝ අයදුම්කරුවන් නිවැරදිව උත්තර සපයා තිබුණි. සමහර අයදුම්කරුවන් විෂයානුබද්ධ කරුණු දැන සිටියද "නිවැරදි නොවන්නේ" යන රටාවට පිළිතුරු සැපයීමට නුහුරු බවක් පෙනේ.

**1.5** නිෂ්පාදන අතිරික්තය ගණනය කිරීමට දී ඇති මෙම ගැටලුවට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ගණනය කර උත්තර සපයා තිබූ අතර අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් අසාර්ථක ලෙස උත්තර සපයා තිබුණි.

**1.6** 2023 වසරේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව 2023 වසරේ ආර්ථික වර්ධන වේගය -2.3% බව අයදුම්කරුවන් පිරිසක් හඳුනාගෙන තිබුණද, ආයදුම්කරුවන් වැඩි දෙනෙක් අසාර්ථක උත්තර සපයා තිබුණේ ඔවුන් ප්‍රායෝගික දැනුම ලබාගැනීමට මහ බැංකු වාර්තාව වැනි නිර්දේශිත ග්‍රන්ථයන් පරිශීලනය නොකිරිම නිසා බව හැගේ.

**1.7** බොහෝ අයදුම්කරුවන් අසාර්ථකව උත්තර සැපයූ ප්‍රශ්නයකි. අසා ඇත්තේ මිල රු 40/= සිට රු 20/= දක්වා අඩුවීමේ දී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 800 සිට එකක 1200 දක්වා ඉහල යාමේදී නිෂ්පාදිතයේ මිල ඉල්ලුම් නම්‍යතාවයයි.

සාමාන්‍යයෙන් මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කිරීමේදී ලක්ෂය නම්‍යතා සමිකරණය ඇසුරින් ගණනය කිරීම සිදුකලද, ලැබෙන පිළිතුර 1 ලෙස වන්නේ නම් එවිට සත්‍ය වශයෙන්ම නම්‍යතාව 1 වන්නේද යන්න නැතහොත් ඒකීය නම්‍යද යන්න තිරණය කිරීමට පහත ක්‍රම 2 අනුගමනය කළ හැක.

| **p** | **Q** | **ලක්ෂ නම්‍යතාවය** |
|---|---|---|
| 40 | 800 | $ED = \frac{4Q}{4P} \times \frac{P}{Q}$ |
| 20 | 1,200 | $ED = \frac{800-1200}{40-20} \times \frac{40}{800}$ |
| | | $ED = \frac{-400}{20} \times \frac{40}{800}$ |
| | | $ED = 1$ |

මෙහිදී ලක්ෂ නම්‍යතාවයට අනුව නම්‍යතාවය 1 කි. නමුත් සැබවින්ම නම්‍යතාවය 1 ක්ද නැතහොත් ඒකීය නම්‍යතාවයක්ද යන්න තිරණය කිරිමට පහත ක්‍රම 2 න් එකක් අනුගමනය කළ යුතුය.

ඒකීය නම්‍ය නම්, එක් එක් මිල ගනන් වලදි ප්‍රමාණය සමාන විය.

| **P** | **Q** | $P \times Q$ | |
|---|---|---|---|
| 40 | 800 | $40 \times 800 = 32,000$ | ප්‍රමාණය ලැබෙන අගයන් අසමාන |
| 20 | 1,200 | $20 \times 1,200 = 24,000$ | නිසා ඒකිය නම්‍යතාවයක් නොමැත |

2% චාප නම්‍යතාවය ගණය කල යුතුය

$$ED = \frac{4Q}{4P} \times \frac{P1+P2}{Q1+Q2} = \frac{400}{20} \times \frac{40+20}{800+1200} = \underline{\mathbf{0.60}}$$

මෙහිදී උත්තර -0.6 වන බැවින් එය 1ට අඩු අගයක් බැවින් මෙහිදි පවතින්නේ අනම්‍ය ඉල්ලුම් තත්ත්වයකි.

සිසුන්ට ඒකීය නම්‍යතාවය ගණනය කිරිමේදි ලක්ෂ නම්‍යතාවය යටතේ උත්තර 1 ලැබූ පමණින්ම ඒකීය නම්‍ය ඉල්ලුමක් ලෙස තීරණය නොකර, චාප නම්‍යතාවය ඔස්සේ නම්‍යතාවය ගණනය කර උත්තරය වශයෙන් 1 ක් ලැබේනම් ඒකීය නම්‍ය ඉල්ලුමක් ලෙස තීරණය කළ යුතු අතර, නැතහොත් 1ට අඩු උත්තරයක් නම් අනම්‍ය ඉල්ලුමක් ලෙසද, 1ට වැඩි ඉල්ලුමක් නම් නම්‍ය ඉල්ලුමක් ලෙසද තිරණය කිරීමට අවශ්‍ය දැනුම ලබාගත යුතුය.

**1.8** ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීමට බලපාන සාධකය ලෙස අනුපූරක භාණ්ඩවල මිල අඩුවීම ලෙස නිවැරදි උත්තර සාර්ථක ලෙස බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන තිබුණි.

**1.9** ඒකාධිකාරී වෙළඳපොලක් සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය ලෙස එය කෙටි කාලයේදී ප්‍රාමාණික ලාභ පමණක් යන්න බොහෝ අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා තිබුණි.

**1.10** නිදහස් වෙළඳපොළ තුළ රජය විසින් අවම මිලක් පැනවීම තුළින් නිෂ්පාදකයින් ආරක්ෂා කරන බව බොහෝ අයදුම්කරුවන් සාර්ථකව හඳුනාගෙන තිබිණි.

**1.11** බොහෝ අයදුම්කරුවන් උද්ධමනය හා මිල මට්ටම සාර්ව ආර්ථික විද්‍යාව තුළින් ආවරණය කරනු ලබන බව සාර්ථකව හඳුනාගෙන තිබුණි.

**1.12** මුළු උපයෝගීතාවය උපරිම වන විට, ආන්තික උපයෝගීතාවය ශුන්‍ය වන බවද බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන ඇත.

**1.13** ආන්තික සංකල්පය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉහළ මට්ටමක ඇත. බොහෝ අයදුම්කරුවන් නිමවුම එක් ඒකකයකින් වැඩිවන විට, මුලු අයභාරයට අලුතින් එකතුවන ප්‍රමාණය ආන්තික අයභාරය ලෙස හඳුනාගෙන ඇත

**1.14** හීනවන පරිමානුකුල ඵල නීතියේ උපකල්පනක් ලෙස විචල්‍ය සාධක යෙදවුම් සමාණතිය නොවන බව අසත්‍ය ලෙසට බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන තිබුණි.

**1.15** වෙළඳපොළ තුළ රජය මැදිහත් වන ආකාරය සඳහා බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි.

**1.16** අවශ්‍යතා හා උවමනා අතර වෙනසට උත්තර සැපයීමේ දී අයදුම්කරුවන්ගේ දැනුම ඉහළ මට්ටමක පැවැති බව ඔවුන්ගේ සාර්ථක උත්තර සැපයීමෙන් තහවුරු විය.

**1.17** ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මට්ටම ඉතා පහළවේ. ඉතා අඩු අයදුම්කරුවන් පිරිසක් සාර්ථක උත්තර සැපයූ අතර සිසුන්ගෙන් බහුතරයක් සපයා තිබූ උත්තර වැරදි සහගත වේ. මේ පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉහල නැංවීමට පියවර ගත යුතුය.

**1.18** කතිපයාධිකාරී වෙළඳපොල, ඒකාධිකාරී වෙළඳපොළ සමග බොහෝ අයදුම්කරුවන් පටලවාගෙන වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි. කතිපයාධිකාරී වෙළඳපොළ පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉහල නැංවිය යුතුය.

**1.19** මූල්‍ය අතරමැදිකරණ ආයතන පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම මඳ බව පෙනේ. ශ්‍රී ලංකා මහ බැංකුවද බොහෝ අයදුම්කරුවන් මූල්‍ය අතරමැදි ආයතනයක් ලෙස සටහන් කර තිබුණි.

**1.20** තිරසාර සංවර්ධනය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මද බව පෙනේ. සමහර සිසුන් තිරසාර සංවර්ධනය හඳුනාගෙන තිබුණද සමාජීය පැතිකඩ යන්න අවබෝධ කරගෙන නොතිබුණි.

## B කොටස

(එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.)

### ප්‍රශ්න අංක 02

**(a)** ආර්ථික භාණ්ඩවල ලක්ෂණ ලෙස නිවැරදි උත්තර සපයා බොහෝ අයදුම්කරුවන් මුළු ලකුණු ලබාගෙන තිබුණි.

**(b)** මූලික ආර්ථික ප්‍රශ්න බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන තිබුනද මිශ්‍ර ආර්ථිකයක, මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආකාරය පිළිබඳව සාර්ථකව උත්තර සපයා නොතිබුණි. අයදුම්කරුවන්ට මිශ්‍ර ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආකාරය පිළිබඳව දැනුවත් විය යුතුය.

**(c)** බොහෝ අයදුම්කරුවන් මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධය පැහැදිලි කර තිබුණද ඊට හේතු පැහැදිලි කිරීමට අසමත් වී තිබුණි ඉල්ලුම් නීතියට හේතු හා ඒවා පැහැදිලි කිරීමට අයදුම්කරුවන් පුහුණු විය යුතුය.

### ප්‍රශ්න අංක 03

**(a)** භාණ්ඩයේ වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය බොහෝ අයදුම්කරුවන් ඉතා සාර්ථක ලෙස උත්තර ඉදිරිපත් කර ඇත.

**(b)** ඉල්ලුමේ මිල නම්‍යතාවය තීරණය කරන සාධක සමහර අයදුම්කරුවන් සාර්ථක ලෙස ඉදිරිපත් කර තිබුණද, සමහර අයදුම්කරුවන් ඉල්ලුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක සටහන් කර වැරදි සහගත ලෙස ඉදිරිපත් කර ඇත.

**(c)** බොහෝ අයදුම්කරුවන්ට මෙම කොටස සාර්ථක උත්තර සැපයීමට අපොහොසත් වී ඇත. පූර්ණ තරගකාරී ආයතනයක් ලාභ උපරිම කරන කොන්දේසි හා එම අවස්ථා ප්‍රස්ථාරයක් ඇසුරින් දැක්වීම සාර්ථකව ඉදිරිපත් කිරීමට බොහෝ අයදුම්කරුවන් අසමත් විය.

### ප්‍රශ්න අංක 04

**(a)** සමහර අයදුම්කරුවන් මුදලට ඇති ඉල්ලුම සඳහා ඇති චේතනාවන් ගනුදෙනු ආරක්ෂණ හා සමපේක්ෂණ ලෙස සාර්ථකව උත්තර සපයා ඇති අතර සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය වැරදි සහගත ලෙස අවබෝධ කරගෙන මුදලේ කාර්යයන් උත්තර ලෙස ලියා තිබුණි.

**(b)** බොහෝ අයදුම්කරුවන් ලාභදායිත්වය හා ද්‍රව ශීලතාවය යන්න හඳුන්වා දී ඇති අතර එම සංකල්ප දෙක අතර සම්බන්ධය පැහැදිලි කිරීමට අපොහොසත් වී ඇත. එනම් ලාභදායීත්වය වැඩිවන විට ද්‍රවශීලතාවය අඩුවන අතර ලාභදායිත්වය අඩුවන විට ද්‍රවශීලතාවය වැඩි වන බව, එනම්, එම සංකල්ප දෙක අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින බව අයදුම්කරුවන් මනාව අවබෝධ කර ගත යුතුය

**(c)** මහ බැංකුවේ ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ ගැන අසා තිබුණද බොහෝ අයදුම්කරුවන් උත්තර ලෙස ලියා තිබුණේ ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ පිළිබඳවයි. අයදුම්කරුවන්ට ප්‍රමාණාත්මක හා ගුණාත්මක ණය ප්‍රතිපත්ති උපකරණ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත යුතුය.

## ප්‍රශ්න අංක **05**

**(a)** සමහර අයදුම්කරුවන් සාපේක්ෂ වාසි න්‍යායේ උපකල්පන පැහැදිලිව අවබෝධ කරගෙන තිබූ අතර සමහර අයදුම්කරුවන් නිෂ්පාදන හැකියා මායිමේ උපකල්පන සඳහන් කර වැරදි සහගත ලෙස උත්තර සපයා තිබුණි.

**(b)** අදාල රට සඳහා **A** හා **B** වෙනුවට රටක නම් භාවිතා කරමින් මෙම ප්‍රශ්නය ඉදිරිපත් කළේ නම් වඩා සාර්ථක උත්තර ලබාගත හැකිව තිබුණි.

**(c)** ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රුපියල අව ප්‍රමාණය වීමේ අහිතකර ප්‍රතිඵල අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කාලීන මෙන්ම න්‍යායාත්මක කරුණුවලින් බැහැර වූ ප්‍රශ්නයක් වන බැවින් බොහෝ අයදුම්කරුවන්ට මෙම ප්‍රශ්නයට ලකුණු ලබාගත හැකිව තිබුණි.

## <u>C කොටස</u>

## ප්‍රශ්න අංක **06**

**(a)** ව්‍යාපාර චක්‍රය ඇඳ එහි විවිධ අවධීන් නම් කර තිබුණද, ඒවා පැහැදිලි කිරීමට අයදුම්කරුවන්ට අමතක වී තිබුණි. ඒ නිසා මුළු ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන් අසමත් විය. විෂය කරුණු දැන සිටියද ප්‍රශ්නය පැහැදිලි කරන්න යන්න කෙරෙහි වැඩි අවධානයක් යොමු කර නොමැත.

**(b)** බොහොමයක් අයදුම්කරුවන් වෙළඳපළ මිලට **(a)** දළ දේශීය වියදම **(b)** දළ දේශීය නිෂ්පාදනය, හා **(c)** දළ ජාතික ආදායම නිවැරදිව ගණනය කර තිබුණි. සමහර අයදුම්කරුවන්ගේ උත්තර නිවැරදි නොවූයේ සුළු කිරීමේදී ඔවුන් විසින් කරන ලද වැරදි නිසාය.

**(c)** දළ දේශීය ආදායම් හා දල ජාතික ආදායම නිර්වචනය කර තිබුනද එම සංකල්පය අතර වෙනස දැක්වීමට අයදුම්කරුවන් බොහොමයක්ම අසමත් වී ඇත. ඔවුන් සංකල්ප දෙක අතර වෙනස පැහැදිලිව දැක්වීම සිදුකර නොමැත.

**(d)** බොහොමයක් අයදුම්කරුවන් ෆිස්කල් ප්‍රතිපත්තිය යන්න නිර්වචනය කර තිබුණද, ව්‍යාපාර මත රටක ෆිස්කල් ප්‍රතිපත්තිය බලපාන ආකාරය පැහැදිලි කර නොමැති නිසා මුළු ලකුණු ලබාගැනීමට අසමත් වී තිබුණි.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනිමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරිම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශිලනය කිරීම.

(5) උත්තර ලිවිමේදි මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදිමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශිලනය කිරිමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනිම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදිමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(12) පෙර සුදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

-***-